**කටුවන ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**
-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013අප්‍රේල් 02දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 5 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කටුවනප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම**
--------------------------------------------------------------------

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින්ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජර්නල් සටහන් අංක 51 මගින් රු. 162,350 බැගින් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම හරකර ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම බැරකළ බව දක්වා තිබුණද ප්‍රධාන ලෙජරයේ පවත්වා තිබූ ඉහත ගිණුම් දෙකටම රු. 162,350 බැගින් හරකර තිබුණි.

(ආ) 2010 වර්ෂයේ බැංකුව විසින් ස්ථාවර නියෝගයක් මගින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවන ලද රු. 122,313 ක එකතු කළ අගය මත බදු මුදලක් සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට ගැලපීමේදී මුදල් ගිණුම බැරකර ප්‍රධාන මුදල් පොත මගින් ගැලපීම් කිරීමට ක්‍රියාකල යුතු වුවත් එසේ නොකර සදොස් ලෙස එම මුදල එකතු කළ අගය මත බදු ගිණුමට බැරකර තිබුණි.

(ඇ) සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි පහන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව බිල්කළ ආදායම රු. 98,600 ක් වුවද රු. 149,637 ක මුදලක් ආදායම් හා වියදම් ගිණුමට බැරකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 463,182 ක ආදායම් , ආදායමට ගෙන නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයට අදාලව ලැබී තිබූ එකතුව රු. 336,734 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 218,835 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමින් අත්හැරී තිබුණි.

(උ) ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

i. කඩිනම් සංවර්ධනය (1999) වැඩසටහන යටතේ ප්‍රදානය කරන ලද වත්කම් විෂයයන් 06 ක අගය වූ රු.3,022,169 ක් හා වටිනාකම සඳහන් නොවූ තැන්නේහේන ඉඩම , HE – 9586 ලීටර් 4500 වතුර බවුසරය හා HE – 9614 ලීටර් 4500 වතුර බවුසරය යන වත්කම් වල අගයන් ද මූල්‍ය ප්‍රකාශණ වල ඇතුළත් කර නොතිබුණි.

ii. මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ වටිනාකම රු.6,255,222 ක් වුවත් රු. 40,899,765 ක් ලෙස ප්‍රාග්ධනිත කරතිබුණි.

iii. ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛනය අතර රු. 204,950 ක වෙනසක් විය.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,146,224 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,167,843 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| i. | වරිපනම් හා බදු | 41 | 35 | 02 |
| ii. | බදුකුලී | 18,007 | 12,572 | 1,138 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,089 | 1,410 | - |
| iv. | වෙනත් ආදායම් | 38,043 | 38,309 | 13,122 |

**2.2.2 වරිපනම් බදු**

සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ වශයෙන් සැලකෙන ප්‍රදේශ ඇතුළත පිහිටි දේපල වලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර වරිපනම් බදු තක්සේරු කර අයකිරීමට ක්‍රියාකර නොතිබුණි.

**2.2.3 මිද්දෙනිය සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලේ කඩ කාමර බදුදීම**

**(අ) නැවත තක්සේරු නොකිරීම**

මිද්දෙනිය සාප්පු සංකීර්ණයේ බිම් මහල , පළමු මහල , කඩ කාමර හා දෙවන මහලේ රැස්වීම් ශාලාව තක්සේරු කර එම වාර්තාව 2008 ඔක්තෝබර් 29 දින සභාව වෙත ලැබී තිබුණි. මෙම තක්සේරු වාර්තාව වසර දෙකකට පමණක් වලංගු බව දක්වා තිබුණද විගණන දිනය වු 2013 නොවැම්බර් 08 දින වන විටත් නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) සාප්පු සංකීර්ණයේ දෙවෙනි මහල (රැස්වීම් ශාලාව) බදුදීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. රැස්වීම් ශාලාවේ මාසික කුලිය රු. 25,000 ක් ලෙස තක්සේරු කර තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2011 නොවැම්බර් 01 දින අංක දපපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛයේ 04 ඡේදය අනුව රැස්වීම් ශාලාව බදු දීමේදී එක්වන් මුදල ලෙස රු. 2,500,000 ක මුදලක් ලබාගත යුතු වුවත් බදුකරුවෙකුගෙන් 2012 මාර්තු 26 දින රු. 1,500,000 ක මුදලක් පමණක් එක්වන් මුදල් ලෙස ලබාගෙන තිබුණි.

ii. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය අනුව බදුකරු සමඟ ගිවිසුම්ගත වියයුතු වුවත් විගණන දිනය වු 2013 නොවැම්බර් 08 දින වන විටත් බදුකරු සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි.

iii. 2012 මාර්තු 26 දින එක්වන් මුදල් ලෙස රු. 1,500,000 ක මුදලක් ගෙවීමෙන් අනතුරුව මාසිකව රු. 25,000 බැගින් කුලී මුදල් ගෙවිය යුතු වුවත් 2013 නොවැම්බර් 08 දින වන විටත් කිසිදු කුලී මුදලක් ගෙවා නොතිබුණි. ඒ අනුව මාස 19 ක් සඳහා හිඟ කුලී මුදල රු. 475,000 ක් වු අතර බදු ගිවිසුම් නොවීම නිසා හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට ද නොහැකි වී ඇති බවද නිරීක්ෂණය විය.

iv. 2013 නොවැම්බර් 07 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී බදුකරු විසින් රැස්වීම් ශාලාවේ විවිධ කොටස් එකතු කර විවිධ ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. එම ඉදිකිරිම් ද්‍රව්‍ය තැනින් තැන දමා තිබීම නිසා ගොඩනැගිල්ල දැඩි ලෙස අපවිත්‍ර වී තිබුණි. මෙසේ ගොඩනැගිල්ල සඳහා කරනු ලබන වෙනස්කම් සඳහා සැලසුමක් ඉදිරිපත් කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඒ සම්බන්ධයෙන් සභාව විසින්ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඇ) සාප්පු සංකීර්ණයේ පළමු මහලේ 22,23,24,25 කඩ කාමර බදුදීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉහත කඩකාමර සඳහා බදුකරුවෙකුගෙන් 2012 මාර්තු 26 දින එක්වන් මුදල් ලෙස කඩකාමරයක් සඳහා රු. 200,000 බැගින් කඩකාමර 04 ක් සඳහා රු. 800,000 ක් ලබාගෙන තිබුණි. මෙසේ එක්වන් මුදල් ලබාගෙන තිබුණද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය අනුව බදුකරු සමඟ ගිවිසුම්ගත වියයුතු වුවත් විගණන දිනය වු 2013 නොවැම්බර් 08 දින වන විටත් බදුකරු සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි.

ii. එක්වත් මුදල් ගෙවා තිබුණද බදුකරු විසින් එක් කඩකාමරයක් සඳහා මාසිකව ගෙවිය යුතු රු. 2,000 ක් බැගින් වු රු. 8,000 ක බදු කුලිය ගෙවීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙම කඩකාමර සඳහා විගණන දිනය වු 2013 නොවැම්බර් 08 දින වන විට මාස 19 ක් සඳහා හිඟ කඩකාමර කුලී මුදල රු. 152,000 ක් විය. බදු ගිවිසුම් නොවීම නිසා මෙම හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට නොහැකි වී ඇති බවද නිරීක්ෂණය විය.

**(ඇ) පළමු මහලේ හිඟ කඩකාමර කුලී**

කඩ කාමර 07 කින් එකතුව රු. 242,370 ක මුදලක් 2013 සැප්තැම්බර් 30 දිනට හිඟව පැවතියද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ඉ) සාප්පු සංකීර්ණයේ බිම් මහලේ මහජන බැංකුව සඳහා ලබාදී ඇති කඩ කාමරයේ බදු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. කඩකාමරයේමාසික තක්සේරු මුදල රු. 30,000 ක් වු අතර ඒ අනුව ලබාගත යුතු එක්වත් මුදල් රු. 3,000,000 ක් වුවද එසේ එක්වත් මුදල් ලබා ගැනීමකින් තොරව කඩකාමරය බදුදී තිබුණි.

ii. මෙම තක්සේරුව වසර දෙකකට පමණක් වලංගු බව තක්සේරුකරු විසින් දන්වා තිබුණ නමුත් ඒ කෙරෙහි සැලකිලිමත් නොවී වසර 10 ක් සඳහා කුලී මුදල් ලබාගෙන තිබුණි. ඒ අනුව නැවත තක්සේරුවකින් කුලී වැඩිකර අයකර ගැනීමට තිබු අවස්ථාව අහිමි වී තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2011 නොවැම්බර් 01 දින අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 06 ඡේදය අනුව තක්සේරුගත බදු මුදල වසර 05 කට වරක් සංශෝධනය කළයුතු බව දක්වා තිබුණද වසර 10 කට බදු ගිවිසුම් අත්සන් කර කුලී මුදල් ලබාගෙන තිබු නිසා ඒ අනුව කටයුතු කිරීමටද නොහැකි වී තිබුණි.

**(ඊ) සාප්පු සංකීර්ණයේ පළමු මහලේ 20 හා 21 කඩකාමර බදුදීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. අංක 20 දරන කඩකාමර රු. 2,000 ක මාසික බදු කුලියකට බදුකරුවෙකුට 2010 ජුලි 07 දින ගිවිසුම්ගතව ලබාදී තිබු නමුත් විගණන අවස්ථාව වන විටත් කිසිදු මුදලක් බදු කුලී ලෙස අයවී නොතිබුණි.

ii. අංක 21 දරන කඩකාමරය 2010 ජුලි මස සිට මහජන බැංකුව විසින් භාවිතා කර තිබු නමුත් අදාල එක්වත් මුදල් සහ බදු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2013 සැප්තැම්බර් 30 දින වන විට රු. 278,000 ක මුදලක් හිඟව පැවතුණි.

**2.2.4 බස් නැවතුම් පොළ උඩුමහල කඩකාමර බදුදීම**

**--------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2012 වර්ෂයේදී නව තක්සේරුවක් මඟින් බදුකුලිය සංශෝධනය කර තිබුණද නව තක්සේරුගත බදු මුදලට අනුව ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

ii. කඩ කාමර 09 කින් එකතුව රු. 568,608 ක මුදලක් 2013 සැප්තැම්බර් 30 දිනට හිඟව පැවතියද මෙම හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.5 පැරණි කඩකාමර බදුදීම**

**---------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. තක්සේරුගත බදු කුලිය 2012 වර්ෂයේදී නව තක්සේරුවක් මඟින් සංශෝධනය කර තිබුණද විගණන දිනය වූ 2013 නොවැම්බර් 08 දින වන විටත් නව තක්සේරුගත බදු මුදලට අදාලව ගිවිසුම යාවත්කාලීන කර නොතිබුණි.

ii. අංක 02 දරන කඩ කාමරයෙහි මාසික බදු කුලිය රු. 3,500 ක් වූ අතර 2013 සැප්තැම්බර් 30 දිනට හිඟය රු. 31,550 ක් විය. අංක 05 කඩ කාමරයෙහි මාසික බදු කුලිය රු. 2,750 ක් වූ අතර 2013 සැප්තැම්බර් 30 දිනට හිඟය රු. 33,000 ක් විය. ඒ අනුව පිළිවෙලින් මාස 09 කට සහ මාස 12 කට අදාලව හිඟ කුලී මුදල් පැවතියද මෙම හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට නොතිබුණි.

**2.2.6 අය නොවූ එක්වන් මුදල්**

**---------------------------**

පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දින අංක දපපා/පපාකො/ 2010/01 දරන චක්‍රලේඛයේ 04 ඡේදය අනුව එක්වන් මුදල් එකවර අයකරගත යුතු අතර එසේ එකවර ගෙවිය නොහැකි බදුකරුවන්ගෙන් එම එක්වන් මුදල වාරික 06 කින් උපරිම මාස 06 ක් තුල අයකර ගැනීමට කටයුතු කළයුතු වුවත් බදුකරුවන් දෙදෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු නොකිරීම නිසා විගණන දිනය වූ 2013 නොවැම්බර් 08 දින වන විට රු. 137,537 ක එක් වන් මුදලක් අයවීමට තිබුණි.

**2.2.7 ඉඩම් විකුණුම් බදු**

**--------------------**

බාහිර පුද්ගලයෙකු විසින් අවස්ථා දෙකකදී ඉඩම් කැබලි කර විකිණීම සඳහා අනුමැතිය ලබාගෙන තිබූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය ප්‍රකාරව ඉඩම් විකුණුම් මුදලින් සියයට 1 ක ගාස්තුවක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

**2.2.8 වාහන ආදායම්**

**----------------**

සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය , කම්පන රෝල , බැකෝ යන්ත්‍රය සහ වැන් රථය කුලී පදනම මත ලබාදී තිබූ අතර විගණන දිනය වූ 2013 දෙසැම්බර් 31 දිනට රු. 719,089 ක කුලී මුදලක් අයවීමට තිබුණි.

**2.2.9 ජල ගාස්තු**

සභාව මගින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතියට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට රු. 5,158,103 ක ජල ගාස්තු මුදලක් අයවීමට තිබුණි.

**2.2.10 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් එකතුව රු. 6,700,516 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

සභාපතිවරයා විසින් විගණන දිනය වූ 2013 නොවැම්බර් 08 දින වන විට 2013 වර්ෂය තුල පත්වීම් 11 ක් ලබාදී වැටුප්, දීමනා හා අර්ථ සාධක අරමුදල් ලෙස එකතුව රු. 1,478,018 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(1) වගන්තිය ප්‍රකාර එම පත්කිරීම් සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) වාහන 2 ක අලුත්වැඩියා සඳහා රු.555,870 ක් වැයකර තිබූ අතර අළුත්වැඩියාවන් නිසි පරිදි ඉටුකර ඇති බවට මෝටර් රථ පරීක්ෂක වාර්තා ලබාගෙන නොතිබුණි.

**(ආ)** දීර්ඝකාලයක සිට හිඟව පවතින එකතුව රු. 73,279 ක ආපදා ණය , විශේෂ හා උත්සව අත්තිකාරම් ශේෂයන් 2013 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**(අ)** කැබ් රථ දෙකක් , ට්‍රැක්ටර් දෙකක් හා වෑන් රථයක් බාහිර ආයතන වලින් ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබූ අතර එම වත්කම් වල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** ජනාධිපති ලේකම්ගේ 2013 ජුනි 05 දිනැති අංක PCMD/RR/2013 දරන ලිපිය මගින් ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ අපහරණය කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින කැබ්රථයක් හා අත් ට්‍රැක්ටරයක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) සේවක ණය පරිපාලනය
(ඉ) වාහන පරිපාලනය